## අනගාරික ධර්මපාලතුමා ප්‍රබෝධමත් කළ ලංකාවේ කාර්මික අධ්‍යාපන ප්‍රතිපත්තිය වත්මන් ආර්ථික සංවර්ධනයට යෝග්‍ය කරගත හැකි ආකාරය

**එම්. ඒ. ජී. ජයනි සමීරා**
සිංහල අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය
*jayani.sameera7@gmail.com*

ඕනෑම දේශයක සමාජ භූමිකාව පිරිහී යන අවස්ථාවන්හි දී එය පෙරට ගෙන ඒමට යුගයට සමකාලීන යුගපුරුෂයෝ බිහි වෙති. ලංකා සමාජය පිරිහී යන විවිධ අවස්ථාවන්හි දී එය ගොඩනැංවීමට දේශයේ පිනට වරින් වර යුගපුරුෂයෝ රැසක් බිහි වූහ. යුරෝපීය සංක්‍රමණ, ආක්‍රමණ බලපෑම හමුවේ ලංකා සමාජය ක්‍රමිකව විපර්යාසයන්ට නතුවෙමින් පැවති අවධියක එනම්, 18 වන සියවසේ මධ්‍ය භාගයේ දී පමණ බිහිවූ උත්කෘෂ්ට යුගපුරුෂයෙකු ලෙස අනගාරික ධර්මපාලතුමා හඳුන්වා දිය හැකි ය. ඔහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය බලපෑම තදින් ක්‍රියාත්මක වූ අවධියේ පිරිහීයමින් පැවති මෙරට සමාජ, ආර්ථික, සංස්කෘතික, ආගමික, අධ්‍යාපනික, භාෂා හා සාහිත්‍යය යන සියලු පාර්ශ්වයන් නඟාසිටුවීමට ස්වකීය ඥානය, ශ්‍රමය හා කාලය කැප කළ සමාජ ශෝධකයෙකි. නමුත් ප්‍රකට ලෙස සම්භාවනාවට පාත්‍ර වී ඇත්තේ ආගමික හා ජාතික ව්‍යාපාරයේ නියැලුණු බෞද්ධ පුරෝගාමියෙකු වශයෙන් පමණි. එබැවින් මෙම පර්යේෂණයෙන් විශේෂ අවධානය යොමු කරනු ලබන්නේ ධර්මපාලතුමා ලංකාටවේ ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රබෝධමත් කිරීමට දැරූ ප්‍රයත්නය හා එම ප්‍රත්පත්ති වත්මන් ලාංකේය ආර්ථික සංවර්ධනයට උපයෝගී කරගත හැකි ආකාරය පෙන්වා දීම යි. අනගාරික ධර්මපාලතුමා බෞද්ධාගම රටින් රටට ප්‍රචාරය කිරීමෙහි ලා මූලිකත්වය ගෙන කටයුතු කළේ ය. මේ ව්‍යාපාරයේ දී ඔහු විශේෂයෙන් ඇමරිකාව, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව වැනි යුරෝපීය රටවලට ද සංක්‍රමණය කළේ ය. මෙහිදී හුදෙක් ධර්ම ප්‍රචාරක කටයුතුවල නියැලීම මතු නොව, එම රටවල සංවර්ධනය, ආර්ථිකය, සමාජ පරිස්ථිතිය හා අධ්‍යාපනය පිළිබඳ ව ද මනා අධ්‍යයනයක යෙදීමට ධර්මපාලතුමා කල්පනාකාරී විය. තත් යුරෝපීය රටවල් ඒ වන විට ලංකාවට සාපේක්ෂ ව ලබා තිබුණු ආර්ථික සංවර්ධනය සියැසින් දුටු එතුමා පුදුම වූවේය. ලංකාවේ නොමැති යුරෝපීය රටවල දක්නට ඇති මෙම ආර්ථික සංවර්ධනයට හේතුව ගවේෂණය කොට අවබෝධ කර ගැනීමට ද ඔහු සමර්ථ වූවේය. මේ රටවල දියුණුවට වෘත්තීය හා කාර්මික පුහුණුව ලත් ශ්‍රමිකයින්ගේ දායකත්වය මනා සෙයින් බලපා ඇති බව ඔහුගේ තියුණු නිරීක්ෂණවලට හසු විය. මේ අනුව රුසියාව වැනි බලවත් රටක් පරාජය කිරීමට ජපානය සමත් වූයේ ඒ වන විට ජපානය ලබා තිබුණු කාර්මික දියුණුව නිසා බව ඔහු වටහා ගත්තේ ය. මෙහෙයින් බ්‍රිතාන්‍යයන්ගෙන් ලංකාව නිදහස් රටක් කිරීමට ද දේශීය කර්මාන්ක ක්ෂේත්‍රයේ උන්නතිය ඇති කළ යුතු බව ධර්මපාලයෝ දූරදර්ශී ලෙස වටහාගත්හ. ධර්මය හා චින්තනය න්‍යායාත්මක තලයෙන් ප්‍රායෝගිකත්වයට ගෙන ඒමට

ධර්මපාලතුමා සමත් වූයේ වාර්ෂික ව මෙරටින් ශිෂ්‍යයන් තෝරා ශිෂ්‍යත්ව ලබා දී කාර්මික අධ්‍යාපනය හැදෑරීමට ජපානයට පිටත් කර හැරීමෙනි. පේෂ කර්මාන්තය, පිඟන් හා මැටි බඳුන් කර්මාන්තය, චිත්‍ර ශිල්පය, සුවඳ විලවුන් කර්මාන්තය, කඩදාසි කර්මාන්තය, ගොවිකම, ඉටිපන්දම් කර්මාන්තය හා ගිනිපෙට්ටි කර්මාන්තය වැනි කර්මාන්ත සම්බන්ධයෙන් වන කාර්මික ශිල්පීය දැනුම ලබා ගැනීම සඳහා ජපන් උසස් කාර්මික විද්‍යාලවලට ශිෂ්‍ය පිරිස් පිටත් කර හැරිය. ඒ සඳහා ප්‍රධාන අනුග්‍රහය හා දායකත්වය සැපයීමට අනගාරික ධර්මපාලතුමා ම මැදිහත් වීම විශේෂත්වය යි. එතුමා මුල් වී ක්‍රියාත්මක කළ මෙම ස්වදේශීය කර්මාන්ත ව්‍යාපාරය හේතුවෙන් සමකාලීන ආර්ථිකය නව ප්‍රබෝධයක් ලද බව කිව යුතුය. එබැවින් ලංකාවේ කාර්මික ප්‍රබෝධය ඇතිකරලීමේ පුරෝගාමියා වශයෙන් අනගාරික ධර්මපාලතුමා සම්භාවනාවට ලක් විය යුතුම ය. එදා ආරම්භ කළ කාර්මික අධ්‍යාපනය අද වන විට ලංකාවේ දීපව්‍යාප්ත ව උසස් අධ්‍යාපන මට්ටමින් ක්‍රියාත්මක වන බව දිස් වුව ද ඒ සඳහා රජයෙන් ලබා දෙන අනුග්‍රහය ප්‍රාමාණික නොවන බව පෙනී යයි. ලංකාවේ ශ්‍රම හා බුද්ධිගලනයට ඉඩ නොදී, දේශීය මානව සම්පත් අගය කරමින් කාර්මික අධ්‍යාපනයේ පවතින මට්ටම නගා සිටුවීමට රජය මැදිහත් වන්නේ නම් එහි ප්‍රතිඵල අනගාරික ධර්මපාල යුගයට වඩා අදට නෙලා ගැනීමේ ශක්‍යතාව පවතින බව පැහැදිලිව ම ප්‍රකාශ කළ හැකි ය. මේ අනුව අනගාරික ධර්මපාලතුමා හුදෙක් ජාතික හා ආගමික ව්‍යාපාරය වෙනුවෙන් කැප වූ උත්තුංග යුගපුරුෂයෙකු වශයෙන් මතු නොව, ලංකාවේ ආර්ථික පක්ෂය නව මඟකට ප්‍රවිෂ්ට කරලීමට උර දුන් දූරදර්ශී චින්තකයෙකු හා අනාගත වක්තෘවරයෙකු වශයෙන් හඳුනාගත හැකි බවත්, ඔහු හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිපත්තිය වත්මන් ලාංකේය ආර්ථික ප්‍රතිපත්තියට ඍජුව ම යෝග්‍ය කර ගැනීමෙන් ලංකාව ඉතා ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයකට ළඟා කරගත හැකි බවත් පෙන්වා දිය හැකි ය. මෙම පර්යේෂණය සඳහා අනගාරික ධර්මපාලතුමා පිළිබඳ ලියැවී ඇති සාහිත්‍ය කෘති, පුවත්පත් හා සඟරාවල පළ වූ ලිපි, අන්තර්ජාලය ඇසුරින් සපයාගත් තතු මහෝපකාරී වූ බව කිව යුතුය.